*සැ. යු.-* 2022.08.05 දින පළ වූ අංක 2,292 දරන *ගැසට් පත්‍රයේ* I/II (අ), III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,293 - 2022 අගෝස්තු මස 12 වැනි සිකුරාදා - 2022.08.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — | වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — | පිස්කල් විකිණීම් ... ... ... | 566 |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — | බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 ජූලි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 සැප්තැම්බර් මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අගෝස්තු මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

අත්තනගල්ල දිසා අධිකරණයේ දී ය

වාසල තන්ත්‍රිගේ හිමාලි ගීතා වික්‍රමසිංහ,
අංක 49, පහල ඉඹුල්ගොඩ,
ඉඹුල්ගොඩ.

අංකය : 2134/මුදල්
ස්වභාවය : මුදල්
වටිනාකම : රු. 7,00,000/-
පිස්කල් අංකය : 03/2020

*.................පැමිණිලිකාරිය.*

*එදිරිව*

කළුබෝවිලගේ චිත්‍රානි,
අංක 1/11, බඳුවත්ත,
අඹගස්පිටිය.

*.........................විත්තිකාරිය.*

අත්තනගල්ල දිසා අධිකරණය විසින් කරන ලද නියෝගය අනුව මෙම නඩුවේ ඉහත නම් සඳහන් විත්තිකාරිය විසින් පැමිණිලිකාරියට ගෙවිය යුතු රුපියල් ලක්ෂ හත (රු. 7,00,000/-)ක මුදල හා 2021.04.30 වැනි දින දක්වා අයවිය යුතු නෛතික පොළිය වන රුපියල් පන්ලක්ෂ විසිදෙදහස් හත්සිය අසූතුන (රු. 522,783/-) ක මුදල ද එකතුව රුපියල් දොලොස් ලක්ෂ විසිදෙදහස් හත්සිය අසූතුන (රු. 12,22,783/-) ක මුදල ද එතැන් සිට ගෙවා නිමවන තෙක් තව දුරටත් නෛතික පොළිය ද, ගෙවීමට අපොහොසත් වී පැහැර හැර ඇති හෙයින්, එකී මුදල අයකර ගැනීම සඳහා මා වෙත නිකුත් කර ඇති ඇස්කීසි බලපත්‍රය මත මා විසින් විත්තිකාරියට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති වර්ෂ 2020ක් වූ මාර්තු මස 05 වැනි දින තහනමට ගෙන ඇති නිශ්චල දේපල වර්ෂ **2022ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින ප. ව. 2.30ට** එකී දේපල පිහිටි සියනෑ කෝරළයේ මැද පත්තුවේ අඹගස්පිටියේ පිහිටි ගල්ළිඳවත්ත නමැති ඉඩම මා විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මහර ප්‍රාදේශීය සභා සීමාවේ අංක 307/A අඹගස්පිටිය ග්‍රාම නිලධාරී වසමේ අඹගස්පිටියේ පිහිටි ගල්ළිඳවත්ත නමැති ඉඩමට එල්. ජී. ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරු මහතා විසින් 1965.09.24 වැනි දින මැන සාදන ලද අංක 815 දරන ප්ලෑනයේ ප්‍රකාර එකී බෙදා වෙන්කල ජී අක්ෂරය දරන කොටසට මායිම්,

උතුරට : ආර්. එම්. ලෝරන් අප්පුහාමිට සහ තව අයට අයිති කුඹුර ද,
නැගෙනහිරට : එච් අක්ෂරය දරන කොටස ද,
දකුණට : මහ පාර ද,
බස්නාහිරට : බී අක්ෂරය දරන කොටස ද

යන මෙහි මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම එකයි එක (පර්. 6.11) ක් විශාල ඉඩම් කොටස සහ එයට අයිති සියලු දේ ද වේ.

දැනට අංක 4/4 හෙනරත්ගොඩ, මුදුන්ගොඩ සී/ස හෙනරත්ගොඩ සකසුරුවම් සහ ණය ගණුදෙනු පිළිබඳ සමූපකාර සමිතියෙන් ලබාගෙන ඇති ණය මුදලට යටත්ව,

(පෙර ලියාපදිංචිය E/1044/23 පත් ඉරුවේ ගම්පහ ඉඩම් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.)

ඒ. එම්. කේ. අමරසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - අත්තනගල්ල.

වර්ෂ 2022 ක් වූ ජූලි මස 28 වැනි දින දී ය.

08-86

## දඹුල්ල දිසා අධිකරණයේ දී ය

## විකිණීමේ දැන්වීමයි

මහනුවර, කටුගස්තොට පාර, අංක 187 හි ප්‍රධාන කාර්යාලය පිහිටි සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්.

*...............පැමිණිලිකාර සමාගම*

මහනුවර දිසා අධිකරණයේ
නඩු අංකය : DMB 00060/17
දඹුල්ල දිසා අධිකරණයේ
ඇස්කිසි අංකය : 28/2022

*එදිරිව*

1. සබරගමුවේ හෙට්ටිආරච්චිලාගේ ජීවන් මහේෂ් හෙට්ටිආරච්චි, අංක 05, වෙළඳ සංකීර්ණ පාර, දඹුල්ල.

*....................විත්තිකරු.*

වර්ෂ 2019ක් වූ ජූනි මස 19 වැනි දින දරන මහනුවර දිසා අධිකරණයේ ඉහත අංක සඳහන් නඩුවේ නඩු තීන්දුව ප්‍රකාර එකී නඩුවේ ඉහත කී විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගමට අයවීමට ඇති රුපියල් අනූ තුන් ලක්ෂ අසූ හත් දහස් හාරසිය හැට අට (රු. 9,387,468.00)ක මුදල අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ඡේදයන්හි සහනයන් ද ලබා ගැනීම සඳහා ආඥකොට ඇති බැවින් ද,

ඉහත කී රුපියල් අනූ තුන් ලක්ෂ අසූ හත් දහස් හාරසිය හැට අට (රු. 93,87,468.00) ක මුදල සහ පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ඡේදයන්හි සහනයන් ද ලබා ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපළට අයත් සියලුම අයිතිවාසිකම්, පරවශතා සහ අනුබද්ධිතයින් ද විත්තිකරුගෙන් කවර ආකාරයෙන් හෝ සියලු අයිතිවාසිකම්, හිමිකම්, බලපුළුවන්කාරකම්, හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි පහත උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයෙහි සඳහන් දේපළෙන් උපදන සහ එකතුවන සියලු කුළී ලාභ සහ අනෙකුත් ආදායම් ද සියලු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුළුව මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපළවල නිශ්චිතව බැඳී ඇති බවට හා ඇස්කිසි කළහැකි බවට ප්‍රකාශ කරන ලද හෙයින් ද, අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ,

**වර්ෂ 2022 ක් වූ සැප්තැම්බර් මස 08 වැනි දින පෙ. ව. 11.00 ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹුල්ල නගර සභා සීමාව තුළ, වගපනහා පල්ලේසිය පත්තුවේ, මාතලේ උතුරු කොටසේ දඹුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දඹුල්ල පහළ වැව ගමේ පිහිටි දෙබරවෙලේ යාය නමැති ඉඩමට ඩබ්. ඒ. එම්. ඩී. විජේසිංහ අවසරලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 2016 ක් වූ නොවැම්බර් මස 10 වැනි දින මැන බෙදා වෙන්කර සාදන ලද අංක 1103 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 1 දරන කොටසට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | යූ. ආර්. ගුණරත්න පෙරේරා හිමිකම් කියන ඉඩම ද, |
| නැගෙනහිරට | : | මෙම ඉඩමේ කොටස ද, |
| දකුණට | : | ඒ. එම්. අනුරරත්න අවසරලත් මිනින්දෝරු තැනගේ අංක 3722 දරන පිඹුරේ කැබලි අංක 8 (ප්‍රවේශ මාර්ගය) සහ ඒ. එම්. අනුරත්න අවසරලත් මිනින්දෝරු තැනගේ අංක 5651 දරන පිඹුරේ කැබලි අංක B ද, |
| බස්නාහිරට | : | ඩබ්. ඒ. එම්. ඩී. විජේසිංහ අවසරලත් මිනින්දෝරු තැනගේ අංක 937/2015 දරන පිඹුරේ කැබලි අංක 1 වන මෙම ඉඩමේ කොටස, |

යන මායිම් තුළ පිහිටි පර්චස් දහඅටක් (පර්. 18)ක් *හෙවත්* හෙක්ටයාර 0.0455ක් විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සමග වේ. මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු අංක L 63/14 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්. එම්. ජේ. ජී. පාලිත,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - දඹුල්ල.

වර්ෂ 2022 ක් වූ ජූනි මස 24 වැනි දින දී ය.

08-87

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.